දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2012 පරීක්ෂණය - 2014 දෙසැම්බර්
Bachelor of Arts General (External) Degree Part II 2012 Examination – December 2014

දේවිසා 3.2 - ජාත්‍යන්තර සම්බන්ධතා
PSG 3.2 - International Relations

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න

---

01. ජාත්‍යන්තර සම්බන්ධතා යනු කුමක් ද යි පැහැදිලි කොට, විඥානවාදී ප්‍රවේශය හා යථාර්ථවාදී ප්‍රවේශය අතර වෙනස පෙන්වා දෙන්න.

02. අන්තර්ජාතික පද්ධතිය තුළ ජාතික රාජ්‍යයන්හි මූලික අංග ලක්ෂණ පැහැදිලිකොට, එම අංග ලක්ෂණවලට අදාළ නූතන අභියෝග සාකච්ඡා කරන්න.

03. "රටක ජාතික අභිලාශයන් අතර ජාතික ආරක්ෂාව ප්‍රධාන වන්නේ ය" ඉහත ප්‍රකාශය විභාග කරන්න.

04. "ජාතික බලය" (National Power) යන්න පැහැදිලි කොට, එය තීරණය වීම සම්බන්ධයෙන් බලපාන ප්‍රධාන සාධක විග්‍රහ කරන්න.

05. ජාත්‍යන්තර පද්ධතිය තුළ අන්තර් රාජ්‍ය සබඳතා පැවැත්වීමේ විධිමත් උපකරණයක් වශයෙන් රටක තානාපති සේවාවේ කාර්යභාරය විග්‍රහ කරන්න.

06. ජාතික රාජ්‍යයකට විදේශ ප්‍රතිපත්තියක් අවශ්‍ය වන්නේ මන් ද? රටක විදේශ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ දී බලපාන ප්‍රධාන කරුණු විභාග කරන්න.

07. වර්තමාන ලෝක ක්‍රමය තුළ අන්තර්ජාතික සංවිධානවල කාර්ය භාරය විවේචනාත්මකව විග්‍රහ කරන්න.

08. "ලෝක සාමය හා සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ කාර්යභාරය බෙහෙවින්ම විවේචනයට භාජනය වී ඇත." මෙම ප්‍රකාශයට ඔබ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

09. නිරායුධකරණය හා අවිපාලනය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

10. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
    I. සාමූහික සුරක්ෂිතතාවය
    II. අයි.එස්.අයි.එස්. (I.S.I.S.) මුස්ලිම් සටන්කාමීන් හා මැදපෙරදිග දේශපාලනය
    III. අන්තර්ජාතික නීතිය (International law)
    IV. ජාතික දේශපාලනය හා ජාත්‍යන්තර දේශපාලනය
    V. අන්තර්ජාතික බල සමතුලිතතාවය